# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120
ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1421 / 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023
දිනය / திகதி / Date – 14/11/2023 පැය 0635

## මාධ්‍ය නිවේදනය

## 2023 දයානන්ද අභියෝගතා විවෘත පිරිමි ජලපන්දු ශූරතාව ශ්‍රී ලංකා පොලිස් ජල ක්‍රීඩා කණ්ඩායම හිමිකර ගනී.





ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමයේ පූර්ණ අනුමැතිය පරිදි කොළඹ ස්ටාර් ෆිෂ් ජලපන්දු ක්‍රීඩා සමාජය දෙවන වරට සංවිධානය කරන ලද දයානන්ද අභියෝගතා ජලපන්දු ශූරතාවලිය 2023.11.11 වන දින රත්මලාන ගුවන් හමුදා පිහිනුම් කටාකයේදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

ඉහත තරඟාවලිය සඳහා ජලපන්දු ක්‍රීඩා කණ්ඩායම් 06 ක් නියෝජනය කරමින් ක්‍රීඩකයින් 78 දෙනෙකු සහභාගී වූ අතර, ශ්‍රී ලංකා පොලිස් ජලපන්දු ක්‍රීඩා කණ්ඩායම නියෝජනය කරමින් ක්‍රීඩකයින් 13 දෙනෙකු ද සහභාගි වී ඇත.

**පොලිස් ජලපන්දු ක්‍රීඩා කණ්ඩායම තරඟ 03 කට සහභාගි වී එම සියළුම තරඟ ජයගෙන 2023 දයානන්ද අභියෝගතා විවෘත පිරිමි ජලපන්දු ශූරතාව දිනාගන්නා ලදි. මෙම තරඟාවලියේ දී ගෝල 11 ක් ලබාගෙන වැඩිම ගෝල ලබා ගත් ක්‍රීඩකයාට හිමි කුසලානය පොලිස් කණ්ඩායම නියෝජනය කල පොලිස් කොස්තාපල් 40072 පුෂ්පකුමාර ක්‍රීඩකයා විසින් දිනා ගන්නා ලදි.**

නියෝජ්‍ය පොලිස්පති එල්.කේ.ඩී. අනිල් ප්‍රියන්ත මහතා පොලිස් ජලපන්දු ක්‍රීඩා කණ්ඩායමේ සභාපති ලෙසද, ප්‍රධාන පොලිස් පරීක්ෂක නලින් ප්‍රනාන්දු මහතා ලේකම් ලෙසද කටයුතු කරනු ලබන අතර, පොලිස් ජලපන්දු ක්‍රීඩා කණ්ඩායමේ පුහුණුකරු ලෙස පොලිස් කොස්තාපල් 83257 පුෂ්පකුමාර නිලධාරියා කටයුතු කරනු ලබයි.මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**